ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
கடற்றொழில் நீரியல் வளத்துறை திணைக்களம்
DEPARTMENT OF FISHERIES & AQUATIC RESOURCES
web site : http://www.fisheriesdept.gov.lk E - mail : info@fisheriesdept.gov.lk
புதிய செயலகம், மாளிகாவத்தை கொழும்பு 10, இலங்கை නව මහ ලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10, ශ්‍රී ලංකාව New Secretariat,Maligawaththa, Colombo 10

මගේ අංකය / எனது இல / My Ref } ධීජදෙ/ආ01/08/07/01/පොල්කඩුවත්ත ඉඩම
ඔබේ අංකය / உமது இல / Your Ref } ධීජදෙ/කළු/01/විස්මා ජලස්
දිනය / திகதி / Date } 2023.11.02.

සහකාර අධ්‍යක්ෂ,
දිස්ත්‍රික් කාර්යාලය,
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව,
කළුතර.

**විස්මා ජලස් ගොඩනැගිල්ලේ පිහිටි අවන්හල කුලියට ලබා දීම සම්බන්ධව යි.**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ අංක ධීජදෙ/කළු/01/විස්මා ජලස් සහ 2023.10.03 දිනැති ලිපිය හා බැඳේ.

02. එම ලිපිය මගින් බේරුවල විස්මා ජලස් ගොඩනැගිල්ලේ යාබද අවන්හල ඵලදායී ව්‍යාපාර කටයුත්තක් සඳහා යොදාගත හැකි අයුරින් කුලී පදනම මත ලබා දීමට සුදුසු බව යෝජනා කර ඇත.

03. එම කාර්යය සඳහා මේ සමග අමුණා ඇති දැන්වීම කළුතර දිස්ත්‍රික් කාර්යාලයේ දැන්වීම් පුවරුවේ පළ කරන ලෙස කාරුණික ව දන්වමි.

අත්. කළේ/ සුසන්ත කහවත්ත
අධ්‍යක්ෂ ජනරාල්
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

**අයේෂා උදයන්ති පතිරණ**
**අධ්‍යක්ෂ (පාලන)**

පිටපත :-

01. ප්‍රාදේශීය ලේකම්, කළුතර - කරු. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දැන්වීම් පුවරුවේ පළ කිරීම සඳහා
02. අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ), ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව - කරු. දෙපාර්තමේන්තුවේ වෙබ් පිටුවේ පළ කිරීම සඳහා

තැ.පෙ. / த.பெ.இ / P.O.Box } 531
පොදු දුරකථනය / பொது தொலைபேசி / Gen. Telephone } +94(0)112446183 (2 lines)
ෆැක්ස් / தொலைநகல / Fax } +94(0) 112449170

## ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

## දැන්වීමයි

**බේරුවල විස්මා ජලස් ගොඩනැගිල්ලේ විවෘත ආපනශාලා කොටස කුලියට ලබා දීම - 2023**

ධීවර හා ජලජ සම්පත්දෙපාර්තමේන්තුව සතු අංක 21, පොල්කොටුවවත්ත, ගාලු පාර, බේරුවල පිහිටි විස්මා ජලස් ගොඩනැගිල්ල කුලී පදනම මත ලබා දීමට කටයුතු කරනු ලැබේ.

එම ගොඩනැගිල්ලේ පවතින කඩ කාමර තුන මේ වනවිට කුලී පදනම මත ලබා දී ඇති අතර දැනට හිස්ව පවතින විවෘත ආපනශාලා කොටසේ විස්තර පහත දැක්වේ.

| කාමරය | විස්තරය | |
|---|---|---|
| විවෘත ආපනශාලා කොටස | දිග අඩි 11 | විදුලි සැපයුම ඇත |
| | පළල අඩි 17 | |

ගොඩනැගිල්ලට පොදු වැසිකිළි 02ක් ඇත. වාහන 04ක් පමණ නැවැත්වීමේ පහසුකම් සහිත ව ඉන්ටර්ලොක් කර සකසා ඇති වාහන අංගනයක් සහිත ය.

- ඔබගේ ඉල්ලීම (කුලී මුදල සඳහන්) නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10 පිහිටි ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ මුදල් අංශය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනවිත් භාරදීම කළ හැක.
- ඉල්ලීම භාර ගන්නා අවසන් දිනය 2023 නොවැම්බර් 24 දින වේ.
- කුලී ගිවිසුම් කාලය අවු. 03කි.
- මේ සම්බන්ධයෙන් අවසාන තීරණය දෙපාර්තමේන්තුව සතු වේ.

සුසන්ත කහවත්ත
අධ්‍යක්ෂ ජනරාල්
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

දිනය : **2023-10-24**